

# රංග කලා අත්හදා බැලීම් සහ රංග කලා ව්‍යවහාර පර්යේෂණ



ආචාර්ය
තරංග චින්තන
දන්දෙනිය

මෙල්බර්න් හි දක්නට ලැබුණා රංගව්‍යවහාරය උපයෝගී පර්යේෂණ (ශ්‍රී ලාංකික) ප්‍රධානව ඇත්තේ තුනකි. ඒවා අතරින් පැරණිම රංගය වන්නේ, මෙම රචකයා විසින් ලාට්‍රෝබ් විශ්ව විද්‍යාලය සමග නාට්‍ය සහ රංගකලා ශාස්ත්‍රපති පර්යේෂණ උපාධිය උදෙසා 2006 වසරේදී සිදුකළ ඇගමෙම්නොන් වේදිකා රංගය යි. අනතුරුව, රචකයාගේම රංගකලාව පිලිබඳ ආචාර්ය උපාධිය උදෙසා මොනෑෂ් විශ්වවිද්‍යාලය සමග සිදුකරමින් පැවති පර්යේෂණයේ කොටසක් ලෙස සිදුකළ ද ගෝඩ් කිංග් ඩ්‍රාමා (2014 ) රංගයයි. තෙවැන්න, වික්ටෝරියා විශ්ව විද්‍යාලය සමග සිදුකරමින් පවතින තම ආචාර්ය උපාධි පර්යේෂණ උදෙසා, 2017 වසරේදී අනුසූයා සුභසිංහ විසින් සිදුකළ නොමළ කෝලම් නම් වූ පර්යේෂණ රංගයයි.

ආසන්නතම අත්දැකීමෙන් ආරම්භ කළහොත්, පොදු ප්‍රේක්ෂකයා නොමළ කෝලම් දකින්නේ කෝළම් ජන රංගයේ හෝ වෙනත් පොදු ජන රංග යේ රංග ආකෘතිය අනුවර්තන කරගත්තා වූ ද, නව සංකේතාත්මක චරිත සහ සිදුවීම් කිහිපයක් එකී ආකෘතියෙන් යුතුව ඉදිරිපත් කරන්නාවූ ද, ඉංග්‍රීසි බසින් ඉදිරිපත් කෙරුණා වූ ද, සිංහල ජන සංගීතය සහ නිර්මාණාත්මක සංගීතය අපූර්ව මිශ්‍රණයක් කලා වූද, සාම්ප්‍රදායික වෙස්මුහුණු කට්ටලයට පරිබාහිරව අළුතින් වෙස් මුහුණු ද යොදාගෙන, ශ්‍රී ලංකාවේ සිට ඒ සඳහාම පැමිණි වෘත්තීය මට්ටමේ රංගධරයන් නර්තනය, ගායනය, සහ වාදනය තම රූපණයේ ආභරණ කරගත්, නව නිර්මාණයක් ලෙසටය. එහෙත් බහුතර ප්‍රේක්ෂකයන් මෙය පර්යේෂණ ව්‍යාපෘතියක් බව සහ, මෙම රංගය සමස්ත පර්යේෂණය උදෙසා කෙසේ කොපමණ ප්‍රතිශතයකින් දායක වේද යන්න නොදැන සිටිබව විශ්වාසය. එනමුදු, නොමළ කෝලම් හි වේදිකා නාට්‍යමය සහ ප්‍රසාංගික ජන රංග ලක්ෂණය මෙල්බර්න් ප්‍රේක්ෂකයින් බහුතරයක් සතුටු කළ බව, ප්‍රේක්ෂක ප්‍රතිචාර නිරීක්ෂණ සහ පසුව ප්‍රේක්ෂක අදහස් හුවමාරු ව මත වටහා ගත්තෙමි.

මේ ආකාරයේ ප්‍රේක්ෂක ප්‍රතිචාර සියළු පර්යේෂණ රංග නොලබන අතර, ඇතැම් පර්යේෂකයන්/පර්යේෂණ, ප්‍රේක්ෂක ප්‍රතිචාර අපේක්ෂා නොකරයි. ඇතැම් පර්යේෂණ රංග සඳහා පැමිණෙන ප්‍රේක්ෂකයා (සහභාගිවෙන්නා) රංගය පිලිබඳ ව්‍යාකුල වීමේ ප්‍රතිපලයක් ලෙස රංගය අවතක්සේරු කිරීමක් පවා සිදුවිය හැකිය.

හුදු රංග ලක්ෂණ දරන්නාවූ රංග ක්‍රියාවකට උදාහරණයක් ලෙස මෙහිදී ඇන්ජෝලිනා විඹිරා පර්යේෂිකාව විසින් මොනෑෂ් විශ්වවිද්‍යාලයේ තම ආචාර්ය උපාධිය පර්යේෂණය සදහා සිදු කළ රංග ක්‍රියාව විස්තර කරනු කැමැත්තෙමි. හඬ සිතියම් ගතකිරීම නම් වූ පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ විඹිරා, මෙල්බර්න්හි තෝරා ගත් ශබ්ද ඝෝෂාව අඩු ස්ථාන කිහිපයක් දී (උදාහරණ මෙල්බර්න් පුස්තකාලයේ පොදු ගැලරි ශාලාව ), තමාම රංග නිරූපිකාව බවට පත්ව, සම්පූර්ණ සුදු ඇදුමින් සැරසී, පැය එකහමාරක පමණ මුළු කාලය පුරාම දෑස රෙදි පටියකින් බැඳ, දිගු සුදු කඩදාසියක් මත වැතිර, තමා අවට ඇසෙන හඬ ට පමණක් ට සවන් දී, එය ගල් අගුරු කැබැල්ලකින් ඇඳි රූප සිතියමක් බවට අනුවර්තනය කිරීම සිදුකරන ලදී. පොදු ගැලරි ශාලාවේ පැවති වෙනත් ප්‍රදර්ශනයක් නැරඹීමට පැමිණි සුළු පිරිස සහ, ඒ අවටින් වැසිකිළිය කරා ගමන්ගත් පිරිස, ප්‍රධාන ප්‍රේක්ෂකයෝ මෙන්ම හඬ ඉපැද්දුවෝ හුද වුහ එහෙත් පර්යේෂිකාව විසින් ශ්‍රවණ ඉන්ද්‍රිය පමණක් උපයෝගී කරගෙන, තමා දැනුවත් සහ නොදැනුවත් ශබ්ද සඳහා තම ශරීරය දැක්වූ ප්‍රතිචාර (එයට ප්‍රේක්ෂකයා දැක්වූ ප්‍රතිචාර, ශ්‍රව්‍ය දෘශ්‍ය පටිගත කිරීම් හරහා) ස්ව අත්දැකීම ක් සේ විග්‍රහයට උපයෝගී කරගැනීම මෙම රංග ක්‍රියාවේ අරමුණ විය. එය සමස්ත පර්යේෂණ ක්‍රියාවේ එක් කොටසක් පමණකි. සාමාන්‍ය ප්‍රේක්ෂකයා හට මෙම රංග පර්යේෂණය, එහි පර්යේෂණ ගැටලුව, පර්යේෂණ සංකල්පීය රාමුව, පර්යේෂණ ක්‍රම වේදය, එය විශ්ලේෂණාත්මකව විග්‍රහ කිරීම, සහ ඉදිරිපත් කිරීම යන කාරණා පිළිබඳ දැනුවත් කමක් නොමැති බැවින් එය ඔවුන්ට රංග ක්‍රියාවක් ලෙස අගයක් නොමැති විය හැක.

ඉහත කී ශ්‍රී ලාංකික රංග වෙනස් වන්නේ ඒවා හුදු රංග ආකෘති සමග වේදිකා රංග ලක්ෂණ වැඩි වශයෙන් භාවිතා කරන බැවිනි. එනමුදු, ඒ රංගයන් හි සංකීර්ණතාව අවබෝද කරගැනීමට අඩු වශයෙන් පර්යේෂණ යට පාදක, හෝ, ඇතැම්විට රංගය මගින් විමසන පර්යේෂණ ගැටලුව වත් තේරුම් ගැනීම වැදගත්ය.

මා අවබෝදකරගත් අයුරින්, අනුසුයා තම පර්යේෂණය මගින් විමර්ෂණය කරන්නේ ඉතිහාසේ යම් තැනකදී පරිණාම වී නැවතුන, එහෙත් දැනටත් පැවතින කෝලම් ජන රංග ය, ආචාරධර්ම රීතීන්ට යටත්ව වර්තමාන සමාජයට අනුවර්තනය කළ හැක්කේ කෙසේ ද යන්නයි. එය රංගය පර්යේෂණයකට ගෙනෙන්නේ නව කෝලම් චරිත සහ අනුවර්තනීය රංග ආකෘතියක් මගින්ය. එමගින් ඇය, පැරණි කෝලම් රංග සම්ප්‍රදාය පවත්වාගෙන එන්නාගේ දැක්ම හා සබැදි විශ්වීය ගනුදෙනුව, නුතන සමාජීය ගැහැණියක ගේ විශ්වීය ගනුදෙනුවක අනුවර්තනයක් බවට පත්කරයි. පැරණි සම්ප්‍රදායේ දී, ගැහැනිය රඟමඩළට තහනම් විය. අනුසුයා කෝලම් රංගයේ මෙහෙයවන්නා හෙවත් සබේ විදානේ ගේ චරිතයට තමාම පත්වෙමින්, නුතන අත්තම්මා සහ මුහුණු දෙකේ ගන්දබ්බ කෝලම හෙවත් අතරුදහන් කළ කාන්තා චරිත, මෛථුන විෂයික හාස්‍ය භාවිතා නොකර (දියසේන කෝලම, ලෑලි කෝලම, චන්ද්‍රා වැනි නව කෝලම් චරිත සමග) ගෙන එන්නේ ඒ කාන්තා දැක්ම නිසාය.

ද ගෝඩ් කිංග් ඩ්‍රාමා රංගය සැලකුවහොත්, මෙය කෝලම් ජන රංගයේ ආකෘතිය වන තානායම්පොළ අඩංගු පූර්ව රංග කොටස, නැටුම් සහ පූජා අඩංගු කොටස, ආඛ්‍යාන රංගය සහ පසු රංගය